**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia

**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## දූෂිතයන්ට බලය දීම

ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහය කෙතරම් දූෂිතව තිබේදැයි පෙන්වාදෙන හොඳම අවස්ථාවක් වූයේ දැන් පැවැත්වෙන මධ්‍යම හා වයඹ පළාත් සභා මැතිවරණය සඳහා අපේක්ෂකයන් තෝරාගත් අවස්ථාවයි. දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් සඳහා උගුරැ කැඩෙනත තෙක් කෑ ගසනා දේශපාලකයන් සිය දේශපාලන නිරුවත ලොවමට පෙන්වා දුන්නේ කිසිදු හිරිකිතයක් නොමැතිවය.

සිය දියණියට දඬුවමක් දුන් නවගත්තේගම ගුරුවරියට අසැබි වදනින් සංග්‍රහ කර ඇය දණ ගැස්සූ දේශපාලක පුබ්බරුවා පිළිබඳව පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කටයුතු කළ ආකාරය ශිෂ්ට සම්පන්න සමාජයකට කිසිසේත්ම නොගැලපෙයි. පළාත් සභාව විසිරුවා හරින්නට ඔන්න මෙන්න කියා තිබියදී ලෝකයට පේන්නට මේ දේශපාලුවාට ඉල්ලා අස්වන්නැයි කියා පළමු විහිළුව කළේ රටේ නායකයාය. දැන් ඉතින් මේ අමනුෂ්‍යයාට නිසි දඬුවම් දෙනු ඇතැයි ජනතාව බලා සිටියදී පළාත් සභා ව සඳහා අපේක්ෂකයින් තේරීමේ සම්මුඛ සාකච්ඡාව සඳහා මොහු කැඳවීම් ලැබුවා පමණක් නොව තේරීම් මණ්ඩලය මොහුගේ නමද අපේක්ෂකයකු ලෙස නිර්දේශ කළේය. ජන මාධ්‍ය විසින් ගෙනයන ලද විරෝධතා වැඩ පිළිවෙල හේතුවෙන් ඔහුට අපේක්ෂකත්වය දීම යාන්තමින් වැළකුණ ද ජනතාවට කොකා පෙන්වමින් ඔහුගේ බෑණාට අපේක්ෂකත්වය ලබාදෙන ලදී . දැන් මාමා බෑනාගේ නමින් ඡන්දය ඉල්ලයි.

අනෙක් පක්ෂ වල කැරැට්ටුවද එයට දෙවැනි වන්නේ නැත . අපේක්ෂක ලැයිස්තු පිරී ඇත්තේ දැන් සිටිනා මන්ත්‍රීවරුන්ගේ ඥාතීන්ගෙනි. පවුල් පිටින් දේශපාලනයට එන්නට මග සාදා ඇත්තේ දේශපාලනයේ ඇති සුර සැප පවුල් වලින් පිටතට යන්නට නොදී රැක ගන්නට ඇති බලවත් ගිජු බව නිසාම ය.

යුක්තිය සාධාරණය වෙුනවෙන් පෙනී සිටිනවා යයි කියන දේශපාලන පක්ෂ හෝ දේශපාලකයක් කිසිවකු මේ මජර ක්‍රමයට විරුද්ධත්වය දක්වා එක වචනයක් හෝ කියනු අපට නොඇසෙයි.

මිනීමරුවෝ ස්ත්‍රී දූෂකයෝ හොරු තක්කඩි සිය ගණනින් පේලි ගැසී විවිධ දේශපාලන පක්ෂ වල බෝඩ් ලෑලි වලට පිටුපසින් සිට ජනතාවගේ ඡන්දය ඉල්ලති. උන් විසි කරනා තෑගි බෝග වලට රැවටෙනවාද නැද්ද යන තීරණය ඇත්තේ මහජනයා අතේය. නැවත නැවතත් දූසිතයන්ට බලය දෙනවාද නැද්ද තීරණය කළ යුත්තේ ජනතාවය. "අපේ එකා නිසා කමක් නැත"යි සිතා දූෂකයෙන් ඉදිරියෙන් ගසන සෑම කතිරයක් පාසාම ශ්‍රී ලංකාව ඇදෙන්නේ අපායේ මුව විටටය.

දැන් ඇත්තේ ජනතාවගේ වාරයයි. ඔබේ දේශපාලන පක්ෂය කුමක් වුවද මේ අප්‍රසන්න ක්‍රමයට විරුද්ධත්වය දක්වා බුද්ධිමත් ලෙස ඡන්දය පාවිච්චි කරන්නට අදිටන් කරගන්න. ඔබේ ඥාතීන්ගෙන් මේ පිළිබඳව ඉල්ලීම් කරන්න. නිහඬව සිටිනවාට වඩා උත්සාහයක් හෝ දැරීම වැදගත් ය.

සංස්කාරක



# අසරණකම බිය සහ හීලෑව

http://www.loopholesblog.org

"මැරිච්ච එකා මළා ඉතුරු වෙලා ඉන්න අපි ජීවත් වෙන්න ඕනැනේ. ඒ මත්තෙ නැහිල වැඩක් තියෙනවැයි" එහෙමත් නැත්තම් "උන් මැරුණෙ වතුරට... මේ ප්‍රශ්නයවත් අපි ජනාධිපති තුමාට කියල විසඳගන්න ඕනෙ" වැනි වදන් පිට වෙන්න ඇත්තේ අසරණ කමටය.

"ආණ්ඩුවත් එක්ක හැප්පෙන්න පුළුවන්යැ" එහෙමත් නැත්තම් "රටේ ජනාධිපති එන්න කිව්වහම නොගිහින් කළු ගලේ ඔළුව ගහගන්නද?" වැනි වදන් පිට වෙන්න ඇත්තේ තියෙන බයටය.

"ජනාධිපති තුමා දන්නෙ වත් නැතුව ඇති අසමජ්ජාති ආමි කාරයෝ කරපු දේවල් වලට එතුමා මක් කරන්නද" එහෙමත් නැත්තම් "කවුරු නැතත් අපේ ජනාධිපති තුමා ට අපි ගැන කැක්කුමක් තියෙනවා... අපට වන්දි දීලා.. අපේ ප්‍රශ්නෙ විසඳලත් දෙයි" යනුවෙන් පවසන්නේ හීලෑවටය.

අසරණ කම හා බිය කෙසේ වෙතත් හීලෑව ඇතිවන්නේ නොදන්නා කම හා මෝඩ කමත් සමගය.

ඔවුන් නොදන්නේ මේ රාජ්‍යයේ ස්වභාවයයි. ඔවුන් නොදන්නේ මහින්ද රාජපක්ෂ යනු රටේ සේනාධිනායක සහ ඔහුගේ සහෝදර ගෝඨාභය රාජපක්ෂ යනු ඔහු යටතේ පවතින ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වරයා බව මෙන්ම ඔවුන්ගේ අණ විධාන නොමැතිව ආරක්ෂා හමුදා අතින් කිසිවක් සිදු නොවිය හැකි බවයි.

ඔවුන් නොදන්නේ කොටින්ට එරෙහිව යුද්ධ කරද්දී ඔවුන්ගේ විධානයේ නායකත්වය අභිමානයෙන් පවසන නමුදු දකුණේ කරන දේශපාලන නොසන්ඩාලකම් වල දී ඔවුන් පට්ට නිශ්ශබ්ද ඇයි දැයි යන්නයි.

ඔවුන් නොදන්නේ සියල්ල මතුපිටින් වසා එම සිදුවීම ආමි එකේ කිහිප දෙනෙකුගේ හිතුවක්කාර වැඩක් දක්වා ඌණනය කර ඔවුන් සියළු දෙනා ජනාධිපති මන්දිරය වෙත රැගෙන විත් වන්දි මුදල් පිරිනමා ඡායාරූප කිහිපයක් දෙස් විදෙස් මාධ්‍යවල පළකර ගැනීමේ මහින්ද රාජපක්ෂගේ මල්වඩම් - මෝර්තෙ දේශපාලනයේ ස්වභාවයයි.

මේ අසරණ මිනිසුන් පෙනීසිටි ඡායාරූපය දුටු විට "වෙඩි කෑ උන්ව විකුණාගෙන කෑවැයි....." කේන්තියක් අපට නොනැගෙන්නේ මේ සියල්ල නිසාවෙනි. කොහොමටත් මිට මොලවගත් සල්ලි කොල වලින් මේ මිනිසුන් ට සුර සැප විඳින්නට ඔවුන්ගේ දරුවන් විසින් ඉතිරිකර ගිය හිස්තැන තුළ කවදාවත් ඉඩ තිබේදැයි සැක සහිතය. බොහෝ විට සොහොන් කොතකට, බස් හෝල්ට් එකකට නැතිනම් සාංඝික දානයකට වියදම් කර අත පිහ දමා ගන්නට පමණක් සිදුවනු ඇත. එහෙත් රටෙහි පුරවැසියන් වටා ඇති අසරණකම, බිය සහ හීලෑව තමන්ගේ බලය පවත්වා ගැනීම උදෙසා පාවිච්චි කරණ පාලකයෙකු නිර්ලජ්ජිත භාවය බල බලා ඉන්නට සිදුවීමේ කේන්තිය නම් දකුණේ දැනුවත් සිංහලයාට ඉතිරිව ඇත.

අප බලන් සිටියේ එහෙමත් නැතිනම් අපගේ යටි හිතේ බලාපොරොත්තුව වූයේ "තියා ගනිං තොගෙ සල්ලි.. තෝ තමයි යකෝ මිනීමරුවා.." යනුවෙන් ජනාධිපතිවරයගේ මූණටම පවසන අම්මා කෙනෙකි.... තාත්තා කෙනෙකි... සහෝදරයෙකි....

එහෙත් සියල්ල එසේ ම සිදුවන්නේ නැත... ඒ ලංකාවයි.....

එය මහින්ද රාජපක්ෂගේ මල් වඩම් මෝර්තෙ දේශපාලනයේ සාර්ථක්ත්වය යි.